# හා හාමිගේ

# කැරට් පාත්තිය



ඩී.එම්. චනුලි දිනුල්යා දිසානායක

# හා හාමිගේ කැරට් පාත්තිය

කතෘ : ඩී.එම්. චනුලි දිනුල්යා දිසානායක

චිත්‍ර : ඩී.එම්. චනුලි දිනුල්යා දිසානායක

දිනය : 2025.02.08

ISBN : 978-624-208-377-3

# පිදුම

සිප් සතර ලබා දෙමින්

ජීවිතය ජයගන්නට මඟ පෙන්වූ

ආදරණීය මහාමායා බාලිකා

විදුහල් මැණියන්ට

සෙනෙහසින්

පුදන්නෙමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිද්ධිමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන ීහෙරණගත්කරණීv ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,


ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


එක්තරා කාලෙක සුදු හාවෙක් හිටියා එයා හරිම ආසයි කැරට් කන්න.



එයාට ලස්සන කැරට් පාත්තියක් තිබුණා. ඒකේ කැරට් හොඳින් හැදිලා තිබුණා. සුදු හාවා හරිම කැමැත්තෙන් එයාගේ කැරට් පාත්තියට සාත්තු කළා.



එක දවසක් උදේ එයා  කැරට් පාත්තියට යනකොට එක කැරට් අලයක්වත් තිබුණේ නෑ.




“කවුද මගේ කැරට් අල ටික හොරකම් කළේ?” හා හාමි කිව්වා. හා හාමි හොඳටම ඇඬුවා. හා හාමිට හොඳටම දුක හිතුණා.



හා හාමි පහුවෙනිදා රෑ හොරෙන් කැරට් පාත්තියට යන්න හිතුවා. ඒ, කැරට් හොරකම් කරන්නේ කවුද කියලා දැනගන්නයි. හා හාමි කැරට් පාත්තියට ගිහින් බලනවිට පුංචි දුඹුරු හා පැටියෙක් හා හාමිගෙ කැරට් හොරෙන් කනවා දැක්කා.



සුදු හාවා දුඹුරු හාවාගෙන් ඇහුවා "ඇයි ඔයා මගේ කැරට් හොරකම් කළේ කියලා". දුඹුරු හාවා කිව්වා "මට බඩගිනි නිසා කෑවේ" කියලා.



“දුඹුරු හා පැටියෝ ආයෙත් කාගෙන්වත් හොරකම් කරන්න එපා. මම ඔයාට කැරට් ඇට ටිකක් දෙන්නම්. ඔයා මං වගේ කැරට් පාත්තියක් හදන්න” කියලා සුදු හාවා කිව්වා.



ටික කාලෙකින් දුඹුරු හා පැංචා සුදු හා හාමිව හම්බෙන්න ගියා.



දුඹුරු හා පැංචා සුදු හා හාමිට එයාගේ කැරට් පාත්තියේ හැදුණු කැරට් ටිකක් දුන්නා. දුඹුරු හා පැංචා හොඳ කෙනෙක් වුණ නිසා සුදු හා හාමිට හරිම සතුටුයි.



අන්තිමේදී සුදු හා හාමියි දුඹුරු හා පැංචයි හොඳ යාළුවෝ වුණා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දූරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-377-3